# NDB වෙතින් 'Cinnamon to the World' තවත් පුරෝගාමී ජාතික මෙහෙවරක්

## - දේශීය කර්මාන්ත නගාසිටුවීමේ තවත් දැවැන්ත පියවරක්

දේශීය අපනයන භෝග වගාව නගාසිටුවීම සඳහා තමන් ගෙන යන වැඩ පිළිවෙල තවත් ශක්තිමත් කරමින් NDB විසින් කුරුඳු වගාකරුවන් සවිබල ගැන්වීමේ සුවිසල් ජාතික වැදගත්මක් සහිත **'Cinnamon to the World'** හඳුන්වා දී තිබේ. එමගින් කුරුඳු වගාකරුවන්" කුරුඳු අපනයනකරුවන් හා කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන්නන් සවිබල ගන්වමින් කුරුඳු අපනයනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ සහ සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ යන මැතිතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පසුගිය ජනවාරි 27 සඳුදා මෙම ජාතික මෙහෙවර උත්සවාකාරයෙන් දියත්කරන ලදි. **'Cinnamon to the World'** යනු ශ්‍රී ලංකාවේ කුරුඳු පිළිබඳව ජාත්‍යන්තරයට විශිෂ්ට තොරතුරු සම්පාදනයක් සිදුකරන වෙබ් අඩවියකි. අපනයන සංවර්ධන මණ්ඩලය" ශ්‍රී ලංකා කුළු බඩු කවුන්සිලය" ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මෙහි ප්‍රධාන සහයෝගිතාකරුවන් වෙති. NDB 'Cinnamon to the World' සඳහා නිර්මාණශීලී සහයෝගය ලියෝබර්නෙට් ආයතනය ලබා දෙන අතර 230interactive විසින් මේ සඳහා සමාජ ජාල මාධ්‍ය සහයෝගය ලබා දෙයි.

NDB 'Cinnamon to the World' යනු මෙරට කුරුඳු වගාව සවිබල ගැන්වීම සඳහා වන හොඳම දීර්ඝ කාලීන ක්‍රියාකාරීත්වයක් සහිත වැඩසටහනකි. ඉස්තරම් කුරුඳු සඳහා තිබෙන ශ්‍රී ලාංකික අනන්‍යතාවය ජාත්‍යන්තරය තුළ තවත් සහතික කරන්නට ඊට හැකියාව තිබේ. NDB සහයෝගිතාවයත් සමගම නිවාස ආශ්‍රිතව වගාකරන කුරුඳු වගාකරුවන් මහාපරිමාණ කුරුඳු අපනයනකරුවන් දක්වා වර්ධනය වීමට මෙයින් අවස්ථාව හිමි වේ. මෙය මුදල් ලබා දීමට පමණක් ක්‍රියාත්මක නොවන අතර මෙම ගොවීන්ට සහ ව්‍යාපාරිකයන්ට සහයෝගිතාවය ලබා දෙන පරිසරයක් නිර්මාණය කරමින් ඉලක්කගත ක්ෂේත්‍රයේ වර්ධනයට උරදෙන වැඩපිළිවෙලකි.

මේ අවස්ථාවේදී අදහස් දක්වූ NDB ප්‍රධාන විධායක නිලධාරී රාජේන්ද්‍ර තියාගරාජා මහතා "ජාතික ආර්ථිකයේ සුවිසල් වැදගත්කමක් උසුලන අපනයන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් දිගින් දිගටම කැපවෙන බැංකුවක් වශයෙන් NDB හඳුන්වන්නට පුළුවන්. තේ" පේෂකර්ම සහ වෙස්මුහුණු වැනි ව්‍යාපාර ක්ෂේත්‍ර ඉලක්ක කරගෙන මේ වන විටත් සහයෝගය ලබා දෙමින් සිටිනවා. කුරුඳු වගා ක්ෂේත්‍රය සංවර්ධනය වෙනුවෙන් අප විසින් ගන්නා ලද මෙම උත්සාහය නිසා රටේ අපනයන හැකියාවන් ඉහළ නංවන අතර ජාත්‍යන්තරයේ ශ්‍රී ලංකාව තවත් සුවිශිෂ්ට වෙනවා." යනුවෙන් පවසා සිටියේය.

තවදුරටත් අදහස් දැක්වූ ඒ මහතා "Cinnamon to the World හරහා කුරුඳු වගා ක්ෂේත්‍රයේ වර්ධනයට සෘජුව හා වක්‍රව දායකත්වය ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. කුඩා පරිමාණ ගෙවතු කුරුඳු වගාකරුවන් සවිබල ගැන්වීම" කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන්නන් සහ මධ්‍යම හා විශාල පරිමාණ අපනයන කරුවන් තව තවත් ශක්තිමත් කිරීම යන අරමුණු පෙරදැරිව NDB විසින් මූල්‍ය පහසුකම් ලබා දෙනවා. කුඩා පරිමාණ කුරුඳු කර්මාන්තකරුවන් තවත් සවිබල ගන්වන අතරම ඔවුන්ට අවශ්‍ය දැනුම බෙදා ගැනීමේ පහසුකම්ද NDB විසින් ලබා දෙනවා.

ශ්‍රී ලාංකීය කුරුඳු වලට ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ වීමට ඇති ඉඩ තවත් පහසු කරමින් ජාත්‍යන්තරයේ මේ පිළිබඳව දැනුවත්භාවය වැඩි කරවන විශිෂ්ට ප්‍රචාරණ ව්‍යාපෘතියක්ද අපි දියත් කරනවා." යනුවෙන් පවසා සිටියේය.

මීට සමගාමීව ගෙවතු ආශ්‍රිතව කුරුඳු වගාවේ නියැලෙන්නන් වෙත ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සපයමින් ක්‍රියාත්මක වීම සඳහා හඳුන්වා දුන් **'grow cinnamon'** ව්‍යාපෘතියද දීර්ඝකාලීන අපේක්ෂාවන් සාර්ථක කරගැනීමට ප්‍රබල රුකුලක් ලබා දේ. මාතර ප්‍රදේශයේ කුරුඳු වගාකරුවන් අසූ දෙනෙකුට පමණ ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබා දෙමින් පසුගියදා උත්සවාකාරයෙන් මෙම වැඩසටහන ආරම්භ කරන ලදි. කුරුඳු ගොවීන් මෙම කර්මාන්තය තුළ ඵලදායී ලෙස රඳවා ගැනීමේ අපේක්ෂාව මූලික කරගනිමින් ඔවුන් වෙත සහනදායී පොලී අනුපාත යටතේ මෙම ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබා දෙන ලදි.

ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (CCC)" ගාල්ල දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය" අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා කුළු බඩු කවුන්සිලය සමග එකතුව මෙම ක්ෂේත්‍රයෙහි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ගේ දැනුවත්භාවය ඉහළ නැංවීමට NDB මුලපුරන ලදි. කුරුඳු වගා ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇතිකිරීමේ ඒකායන අරමුණින් මෙම සහයෝගිතාවය ගොඩනැගීමට කටයුතු කර තිබේ. කුරුඳු වගා ක්ෂේත්‍රයේ දීර්ඝ කාලීන සංවර්ධනයක් අත්කර ගැනීමට මෙවන් යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීම කාලීන අවශ්‍යතාවයකි.

අපනයන සංවර්ධන මණ්ඩලය" ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකා කුළු බඩු කවුන්සිලය සමග සහයෝගිතාවය ගොඩනගා ගනිමින් කුරුඳු වගාවේ සංවර්ධනය වෙනුවෙන් තවත් බොහෝ වැදගත් ක්‍රියාමාර්ග රැසක් NDB විසින් ක්‍රියාවට නංවා තිබේ. කුරුඳු වගාව ආශ්‍රිත විශේෂ අවස්ථාවන් සඳහා අනුග්‍රාහකත්වය සපයමින් ශ්‍රී ලාංකීය කුරුඳු ප්‍රවර්ධනය කිරීම" දේශීය සහ විදේශීය ප්‍රදර්ශන අවස්ථාවන්හිදී දායකත්වය ලබා දීම සහ කුරුඳු වගා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සවිබල ගන්වන ඔවුන්ගේ ශක්‍යතාවයන් වර්ධනය කරන උපදේශනය ලබාදීම වැනි කාර්යභාරයන් NDB විසින් සිදු කරන අතර ඊට වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී තිබේ.

"වර්තමානයේදී ශ්‍රී ලාංකීය කුරුඳු නැතිනම් සැබෑ කුරුඳු ලෝකයේ ඉස්තරම්ම කුරුඳු ලෙස ගෞරවයට පාත්‍රවී ඇති අතර ලෝකය පුරාම හොඳ අලෙවියක් පවත්වාගෙන තිබෙනවා. 2012 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 12"630 මුදල් ප්‍රමාණයක් කුරුඳු වගාව නිසා මෙරටට ලැබුණු අතර 2020 වන විට වෙනත් කුරුඳු ඇතුළු කුළු බඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වලින් ඇමෙරිකානු ඩොලර් බිලියන එකක විදේශ විනිමයක් අපේක්ෂා කරනවා. මෙම නව්‍යකරණයෙන්" තාක්ෂණික සහයෝගය ලබාදීමෙන්" පළපුරුද්ද බෙදා ගැනීමෙන් ශ්‍රී ලාංකීය කුරුඳුවල ගුණාත්මක තත්ත්වය තවත් ඉහළ යනවා. එය මෙරට කුරුඳු වගා ක්ෂේත්‍රය තවත් ඉදිරියට ගෙන යාමක් ලෙස අපි විශ්වාස කරනවා. අපගේ මෙම උත්සාහය නිසා ග්‍රාමීය ජන ජීවිත සවිබල ගැන්වෙන අතර ශ්‍රී ලාංකීය කුරුඳු වෙළෙඳ නාම ප්‍රතිරූපයට ජාත්‍යන්තරය තුළ ඇති වටිනාකම වැඩි වෙනවා. අපනයන ආදායම ඉහළ යාමෙන් රටේ ආර්ථිකය ශක්තිමත් වෙනවා. කුරුඳු වගා ක්ෂේත්‍රයට පමණක් නොවෙයි සර්ව ආර්ථිකයටම අප ලබා දෙන දායකත්වය 'Cinnamon to the World' ව්‍යාපෘතියෙන් පිළිඹිබු වෙනවා." යනුවෙන් රාජේන්ද්‍ර තියාගරාජා මහතා තවදුරටත් අදහස් දැක්වීය.

- සමාප්තයි -

**<u>සංස්කාරකවරුන් වෙත:</u>**

කුරුඳු (Cynnamomum Zeylanicum Blume) යනු ශ්‍රී ලංකාවේ වැවෙන පැරණිතම සහ වඩාත් ඉහළ වැදගත්කමක් සහිත භෝගයකි. කුරුඳු පුරාණ අරාබි ලෝකයේ ජනප්‍රියම කුළුබඩු වර්ගයක් වූ අතර විලවුන් වර්ග නිෂ්පාදනයට මෙන්ම ඖෂධ නිෂ්පාදන සඳහාද අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගනී. අරාබි වෙළෙන්දන් විසින් ප්‍රථමයෙන්ද යුරෝපීයයන් විසින් දෙවනුවද කුරුඳු වෙළෙඳාමේ පාලනය සියතට ගන්නා ලද අතර එම සබඳතා ගොඩනැගීම නිසා ශ්‍රී ලංකාවට ජාත්‍යන්තරයේ සුවිශේෂ ස්ථානයක් හිමි විය. 15 වන සියවසේදී දේශ ගවේෂණ සඳහා බලපෑ ප්‍රධාන හේතුවකි කුරුඳු සොයා ගැනීම. ඒ සමග ඓතිහාසික වශයෙන් කුරුඳු වලට අතිශය වැදගත් කමක් හිමි වී තිබේ.

සම්ප්‍රදායිකව කුරුඳු ලෙස භාවිතයට ගන්නේ කුරුඳු ගසෙහි තලන ලද පොත්තයි. ලොව පුරා බොහෝ රටවල විශාල වශයෙන් කුරුඳු වගාව සිදු කෙරේ. නමුත් කුරුඳු වලට අනන්‍ය සැබෑ පරිසරයක් තුළ නිසි සංරක්ෂණයක් සහිතව සැබෑ කුරුඳු වගාකරන්නේ ශ්‍රී ලංකාවේ පමණි. ශ්‍රී ලංකාවේ වගාකරන කුරුඳු වල සැබෑ සුවඳ" නියම රසය සහ ඖෂධීය වටිනාකම යන ගුණාංග තවමත් නිසි ලෙස අඩංගු වේ. ගෝලීය වෙළෙඳපොළට ස්වභාවික කුරුඳු සපයන එකම සැපයුම් කරු වීමේ භාග්‍යය ශ්‍රී ලංකාවට හිමිව තිබේ.

මීගමුව සහ කොළඹ අතර වෙරළ සීමාව ආශ්‍රිත ප්‍රදේශයේ සහ හම්බන්තොට ඇතුළුව දකුණු පළාතේද මේ වන විට වැඩි වශයෙන් කුරුඳු වගාව සිදු වේ.

*<u>අපනයන වෙළෙඳපොළ සහ අනාගතය</u>*

කුරුඳු අපනයනයෙන් 65] ක් කුරුඳු තොග වශයෙන් අපනයනය කෙරන අතර අගය එකතු කරන ලද නිෂ්පාදන (කැබලි කුරුඳු" කුරුඳු තෙල්" ඔලියොරෙසින්" කුරුඳු පිටි" පෙති) වශයෙන් අපනයනය කරන්නේ 35] පමණි. කුරුඳු සහ කුරුඳු මල්" කුරුඳු කෝටු (කිලෝ 01 හෝ ඊට අඩු පැකට්ටු)" කුරුඳු පතුරු" අඹරන ලද කුරුඳු සහ කුඩු බවට පත්කරන ලද කුරුඳු ඇතුළු එකිනෙකට වෙනස් නිෂ්පාදන 12 ක් වශයෙන්ද කුරුඳු අපනයනය කෙරේ.

*<u>කුරුඳු භාවිතා කරන අවස්ථා</u>*

- ඉවුම් පිහුම් සහ බේක් කරගැනීම් සඳහා වැඩි වශයෙන් භාවිතා කරයි. සලාද" රසකැවිලි" බීම වර්ග" සුප්" ස්ටු
  සහ සෝස් වර්ග සඳහාද භාවිතා කරයි
- කුරුඳු රසැති තේ වැනි අගය එකතු කළ නිෂ්පාදන ජනප්‍රිය වෙමින් පවතින අතර කුරුඳු පොතු උණුසුම් ජලයේ දමා පානය කිරීමද බෙහෝ රටවල ජනප්‍රිය වෙමින් පවතී
- ආයුර්වේද ප්‍රතිකාර සඳහා වැඩි වශයෙන් යොදා ගනී
- ආහාර නිෂ්පාදන රස ගැන්වීම සඳහා යොදා ගනී
- සුවඳ විලවුන් හා ඖෂධ නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගනී